පොළොන්නරුව මහා නගර සභාව
පොළොන්නරුව දිස්ත්‍රික්කය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 මාර්තු20 සිට 2018 දෙසැම්බර්31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන2019 අප්‍රේල් 24 දිනවිගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳවිගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව හා විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූලි 03 දිනසභාවට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑමහැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහඑදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලවසත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතයසඳහා පදනම

(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි. | ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කල යුතු වේ. | 2019 වසරේ සිට එය අනුගමනය කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත. |

(ආ) ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය තුල පුලතිසි බුද්ධි මණ්ඩපයේ පුස්තකාලයට(“e-Library”) ඇළුමිනියම් වෙන්කරණයක් සකස් කිරීම සඳහා වැය වූ රු.1,137,916 ක් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ස්ථාවර වත්කම් සඳහා වැය කළ මුදල් ප්‍රාග්ධනිත කළ යුතු වේ. | වත්කම් හර සමුච්චිත අරමුදල බැර ලෙස නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ වැඩ නිම කර මුදල් ගෙවා අවසන් ව්‍යාපෘති 02 ක වටිනාකම රු.399,841 ක් තවදුරටත් කර්මාන්ත ණයගැති සහ | ගිණුම් නිවැරදි කළ යුතු වේ. | ණයහිමි ගිණුම හර සමුච්චිත අරමුදල් ගිණුම බැර ලෙස සංශෝධනය කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| | කර්මාන්ත ණයහිමි යටතේ ගිණුම්ගත කර තිබුණි. | | |
| (iii) | කාලච්ඡේදයේ ආරම්භක හිඟ උසාවි දඩ ශේෂය රු.2,573,110 ක් අඩුවෙන් දක්වා තිබුණි | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතු වේ. | මෙම ගැලපීම 2019 මූල්‍ය ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කරමි. |
| (iv) | 2018 වර්ෂයේ අගෝස්තු මාසයට අදාලව ලැබිය යුතු උසාවි දඩ රු.594,817 ක් ගිණුම්ගත කර නොතිබුණු අතර අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා අනෙකුත් මාසවලට අදාලව ලැබිය යුතු උසාවි දඩ මුදල් හඳුනාගෙන නොතිබුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | 2019 වසරේ ඉදිරියට ගෙන ගිය ශේෂයන්ට ගැලපීම් කිරීමට කටයුතු කරමි. |
| (v) | තමන්කඩුව ප්‍රාදේශීය සභාවට අදාළව පොළොන්නරුව මහා නගර සභාවට ලැබුණු හිඟ උසාවි දඩ මුදල් රු.5,970,691 කින් පොළොන්නරුව ප්‍රාදේශීය සභාවට ගෙවිය යුතු රු.1,351,764 ක මුදල ගෙවිය යුතු ශේෂ යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | ගෙවියයුතු ශේෂය නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | ණයහිමි යටතේ ගිණුම්ගත කළ නොහැකි බව දන්වා සිටිමි . |
| (vi) | තමන්කඩුව සතිපොළ හා නව වෙළඳ සංකීර්ණය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ විදුලි සෝපානය සවිකිරීමට වැය වූ රු.5,227,336 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණු අතර, ඒ සඳහා ලද හිඟ උසාවි දඩ මුදලින් මහා නගර සභාවට අයත් වටිනාකම වන රු.4,043,867 කින් රු.3,300,512 ක් හිඟ උසාවි දඩ මුදල් ගිණුම බැර කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | රු.5,227,336 ක මුදල වත්කම් හර, ප්‍රා.යෙ.ආ.දා. ගිණුම බැර කිරීමටත් රු.3,300,512 ක මුදල ලැබිය යුතු උසාවි දඩ ගිණුම හර, සමුච්චිත අරමුදල් ගිණුම බැර කිරීමට කටයුතු කරමි. |
| (vii) | 2018 වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | තොරතුරු ලදපසු වාර්තා කිරීමට සටහන් කර ගතිමි. |

| | | | |
|---|---|---|---|
| (viii) | මහා නගර සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි අයිතම 07 ක වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. | නිවැරදි වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කල යුතු වේ. | මෙම ඉඩම් තක්සේරු කර අදාළ වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

(ඇ) නොසැසඳුණු ගිණුම්

------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල උපලේඛනය අනුව හිඟ කඩ කුලී ශේෂය රු.1,527,075 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එය රු.1,334,875 ක් වූයෙන් රු.192,200 ක නොසැසඳීමක් පැවතුණි. | උපලේඛනය හා ගිණුම සසඳා නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ. | මේ වන විට ලේඛන නිවැරදි ලෙස යාවත්කාලීන කරන බැවින් ඉදිරියේදී මෙවැනි දෝෂ පැන නොනඟිනු ඇත. |
| (ii) | 2018 දෙසැම්බර් 31 වන දිනට වරිපනම් ලේඛනවලට අනුව කලින් ලද වරිපනම් ආදායම රු.136,398 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ උපලේඛන අනුව එම ශේෂය රු.422,203 ක් වූයෙන් රු.285,805 ක නොසැසඳීමක් පැවතුණි. | ලේඛන හා උපලේඛන සසඳා නිවැරදි කිරීමට කටයුතු කල යුතු වේ | මේ වන විට ලේඛන නිවැරදි ලෙස යාවත්කාලීන කරන බැවින් ඉදිරියේදී මෙවැනි දෝෂ පැන නොනඟිනු ඇත. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.457,284,175 ක් වූ ගිණුම් විෂයයන් 09 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂවලට අදාලව තහවුරු කරන තොරතුරු ඉදිරිපත් කල යුතු වේ. | ස්ථාවර වත්කම් ලේඛන ආරම්භ කර නොතිබුණු අතර මේ වන විට එම ලේඛන ආරම්භ කර ඇත. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | මහා නගර සභා ආඥා පනත | | | |
| (i) | 247 (අ) වගන්තිය | මහා නගර සභා බල ප්‍රදේශය තුළ සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 13 කින් සමාලෝචිත වර්ෂයටගාස්තු අයකර නොතිබුණි. | ගාස්තු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි |
| (ii) | 272 වගන්තිය | පොළොන්නරුව මහා නගර සභාව විසින් අනුරාධපුර මහා නගර සභාවට අයත් අතුරු ව්‍යවස්ථා වැළදගෙන ඇති නමුත්, ඒවා මෙතෙක් ගැසට් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගැසට් කිරීමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී ගැසට් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | 2015 ජූලි 14 දිනැති අංක | අදාල කාර්යය නිමකර දින 10 ක් | ප්‍රමාදවීමකින් තොරව අත්තිකාරම් පියවීමට කටයුතු | සියලු අංශ ප්‍රධානීන් දැනුවත් කර නිවැරදි කිරීමට කටයුතු කරමි. |

| | | | | |
|---|---|---|---|---|
| | 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) | ඇතුලත ලබාගත් අත්තිකාරම් මුදල පියවිය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ අවස්ථා 11 කදී ලබාදී තිබූ අත්තිකාරම් මුදල් මාස 01 සිට මාස 6 ½ දක්වා කාලයක් ප්‍රමාද වී පියවා තිබුණි. | කල යුතු වේ. | |
| (ii) | මු.රෙ 570(ආ) | තැන්පත් කළ දින සිට වසර 5 සිට 8 දක්වා කාලයක් ගතව ඇති නමුත්හිමිකම් නොපෑ කර්මාන්ත තැන්පත් රු. 319,292 ක් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි | මු.රෙ. ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | රු.19,242 ක මුදල නාගරික ඉංජිනේරුවරයාගේ නිර්දේශය යටතේ අදාළ ආයතනය වෙත ලබාදීමටත්, නිර්දේශ ලබාදිය නොහැකි අත රැඳවුම් ඉදිකිරීම්වල අඩුපාඩු සම්පූර්ණ කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| (iii) | මු.රෙ. 571 සහ 572 | තැන්පත් කර වසර 02 සිට 06 දක්වා කාලයක් ගතවී ඇති රු. 159,878 ක් වටිනා පොදු තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මු.රෙ. ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (iv) | මු.රෙ. 756 | 2019 මැයි 24 දින විටත් 2018 වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය පත් කර නොතිබුණි. | මු.රෙ. ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදුකල යුතුවේ. | සමීක්ෂණ මණ්ඩලය පත්කර සමීක්ෂණ කටයුතු ආරම්භ කිරීමට මූලික පියවර ගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1989 ජනවාරි 20 දිනැති අංක 541/17 දරන ගැසට් පත්‍රයේ පළකර ඇති සම්මත අතුරු ව්‍යවස්ථා II කොටස<br>---------------- | | | |
| | 2(3)(1) වන ඡේදය | ප්‍රචාරක දැන්වීම් ප්‍රදර්ශනය කිරීමේ බලපත්‍රය සඳහා මුදල් ගෙවීමට පෙරබලපත්‍ර නිකුත් කර තිබුණි. | ගාස්තු අයකර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ඈ) | 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත<br>---------------- | | | |
| | 23(ආ) වගන්තිය | පරිසර බලපත්‍ර කල් ඉකුත් වී තිබුණු කර්මාන්ත 36 ක් සඳහා නව බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | කල් ඉකුත් වී ඇති පරිසර බලපත්‍ර හඳුනාගෙන ඒවා අළුත් කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. නිවැරදි කිරීමට කටයුතු කරමින් පවතී. |
| (ඉ) | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය | | | |
| (i) | නියෝග අංක 1.1 | නගරාධිපතිවරයා විසින් භාවිතා කල ජීප් රථයට සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් සහ | ගැසට් නිවේදනය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | | දෙසැම්බර් මාසවලදී සීමාව ඉක්මවා ඉන්ධන ලීටර් 239 ක් යොදවා රු. 30,959 ක් වැය කර තිබුණි. | |
| (ii) | නියෝග අංක 4.II | නියෝජ්‍ය නගරාධිපතිවරයාට හිමි රු. 2,500 ක මාසික නිවාස දුරකථන දීමනාව ඉක්මවා අගෝස්තුසිට දෙසැම්බර් දක්වා මසකට රු.2,500 බැගින් රු. 12,500 ක් වැඩිපුර ගෙවා තිබුණි. | ගැසට් නිවේදනය ප්‍රකාරව පිළිගනිමි. කටයුතු කල යුතු වේ. |

1.5 ලැබිය යුතු ගිණුම්

--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ------------- | ------------------------------------ |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ගිණුම් ශේෂ ලෙස දක්වා තිබුණු, අය කිරීමට තිබෙන වැඩ සඳහා රු.2,699,839 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කල යුතු වේ. | ඉදිරියේදී එම මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. |
| (ආ) | 2016 වර්ෂයේ පොළොන්නරුව සතිපොළ බදු දීමෙන් අයවිය යුතු රු.45,000 ක හිඟ මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වත්කම් බෙදාදීමේ නිර්දේශය මඟින් මෙම ශේෂය මහා නගර සභාවට අයත් බැවින් හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | 2016 වර්ෂයේ වත්කම් බඳුදීම යටතේ තමන්කඩුව ප්‍රාදේශීය සභාව සමඟ ගිවිසුම් අත්සන් කර ඇති බැවින් අයකර ගැනීම සම්බන්ධව පොළොන්නරුව මහා නගර සභාවට නීතිමය ප්‍රතිපාදන නොමැත. |

2. මූල්‍ය සමාලෝචනය

------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 මාර්තු 20 දින සිට දෙසැම්බර් 31 දක්වා කාලච්ඡේදය සඳහා මහා නගර සභාවේ පුනරාවර්ථන ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.5,017,287 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

----------------------------------------------------------------------------------------

2018 වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදායම් | දෙසැ. 31 දිනට හිඟය |
|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 13,314,393 | 7,703,568 | 11,748,287 | 13,040,325 |
| (ii) | කුලී | 27,303,475 | 5,106,092 | 15,082,621 | 1,517,694 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,657,500 | 2,657,500 | 1,479,685 | - |
| (iv) | වෙනත් ආදායම් | 18,836,978 | 2,313,371 | 6,116,112 | 32,305,651 |
| | එකතුව | 62,112,346 | 17,780,531 | 34,426,705 | 46,863,670 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත කාලච්ඡේදය සඳහා සභාව විසින් රු.62,112,346 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර ඉන් බිල්කර තිබුණ් රු.17,780,531 ක් පමණිඑහෙත් .රැස්කර තිබූ ආදායම රු.34,426,705 ක් විය. | ආදායම් ඇස්තමේන්තු සපුරාගැනීමට කටයුතු කල යුතු වේ. | මෙම වසරේ ආදායම් රැස්කර ගැනීම සඳහා විධිමත් ක්‍රමවේදයක් සකස්කර ඇත. |

2.2.3 වරිපනම් හා බදු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු ලේඛනය අනුව 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් මුදල රු.12,746,949 ක් වූ අතර, එම බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ කසල බදු මුදල රු.2,397,000 ක් හා හිඟ විනෝද බදුද රු.293,375 ක් වූ අතර, එම බදු අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | හිඟය අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ඇ) | | කසල බදු අයකල යුතු සියලු ආයතනවලින් බදු අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

2.2.4 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | රෝහල ඉදිරිපිට වූ රථගාලෙන් දෛනිකව අයවන කුලී ආදායම් පිළිබඳ තොරතුරු ඇතුලත් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | විධිමත් ක්‍රමවේදයකට අනුව දෛනිකව එකතු වන ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | 2018 ඔක්තෝබර් 25 වන දින සිට පොළොන්නරුව මහ රෝහල ඉදිරිපිට රථ ගාලෙන් මුදල් අයකර ගැනීම සඳහා බිල්පොත් නිකුත් කර නොතිබුණි. | මුදල් අයකර ගැනීමේදී බිල්පත් නිකුත් කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මහා නගර සභාව සතු කඩ කාමර 208 න් බොහෝ කඩ කාමර ගිවිසුම්ගත කුලීකරුවන් විසින් අතුරු බදුදීම් මඟින් වර්තමාන තක්සේරු මුදලට වඩා වැඩි ආදායමක් උපයන බැවින් ගිවිසුම් යාවත්කාලීන කර, නියමිත පාර්ශවයන්ගෙන් ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කාලානුරූපීව ගිවිසුම් යාවත්කාලීන කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ඈ) | රෝහල හන්දිය නව වෙළඳ සංකීර්ණයේ අංක 23 කඩ කාමරය, බිම් මහලේ අවන්හල හා උඩු මහලේ අවන්හල 2018 අගෝස්තු 01 දින බදුදී තිබුණද, 2019 මාර්තු 28 දින වන විටත් ගිවිසුම්ගත වී නොතිබුණි. | විධිමත් පරිදි බදුකරුවන් සමඟ ගිවිසුම්ගත විය යුතු වේ. | පිළිගනිමි. |
| (ඉ) | 2018 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව මහා නගර සභාවට අයවිය යුතු හිඟ කඩ කුලී ආදායම රු.1,334,875 ක් හා හිඟ වත්කම් බදු දීමේ ආදායම රු.41,249 ක් වූ අතර, එම බදු මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි. | අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

2.2.5 වෙනත් ආදායම්

--------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත කාලච්ඡේදය සඳහා මහා නගර සභා බල ප්‍රදේශය තුළ සිදුකර තිබූ ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ සමීක්ෂණයඅනුව විශාල ප්‍රමාණයේ දැන්වීම් පුවරු 21 කින් අයකරගත හැකිව තිබූ ආදායම රු. 3,391,750 ක් විය. | ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් නිලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,128,161 ක් හා මුද්දර ගාස්තු රු.28,770,490 ක් විය. | ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

මහා නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම, පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව සහ සුභ සාධනය යන සභාව විසින් ඉටුකල යුතුව තිබූ කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථා අනුව මහා නගර සභාව විසින් ඉටුකල යුතුව තිබුණු කර්තව්‍යයන් වෙනුවෙන් සමාලෝචිත කාලච්ඡේදය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කල යුතු වේ. | පිළිගනිමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රු. 956,082 ක් වූ මුදල් වසර 02 සිට 04 දක්වා කාලයක් ගතව ඇතත් අදාල වැඩසටහන් සඳහා යෙදවීමෙන් තොරව පොදු | ලැබුණු ප්‍රතිපාදන මුදල් අරමුණුගත කාර්යයන් හඳුනාගෙන යෙදවිය යුතු වේ. | පිළිගනිමි. |

| | | | |
|---|---|---|---|
| | තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | | |
| (ආ) | මහා නගර සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට සේවයේ යොදවා තිබූ කාර්යමණ්ඩලය 217 ක් වූ අතර ඉන් ලිඛිතව රාජකාරි පවරන ලද සංඛ්‍යාව 38 ක් පමණක් විය. | සියලු නිලධාරීන්ට රාජකාරී ලිඛිතව පැවරිය යුතු වේ. | පිළිගනිමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය
------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) | 2018 මාර්තු 19 දින පොළොන්නරුව මහා නගර සභාව පිහිටුවීමේදී තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ සේවය කළ කාර්යමණ්ඩලය 93 දෙනෙක් පොළොන්නරුව මහා නගර සභාව වෙත අන්තර්ග්‍රහනය කරගෙන තිබූ අතර මීට අදාළව පත්වීම් ලිපි නිකුත් කිරීමක් 2019 මාර්තු 21 විගණන දින වන විටත් සිදුකර නොතිබුණි. | පත්වීම් ලිපි නිකුත් කිරීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |
| (ii) | මහා නගර සභාව වෙත අනුමත කාර්යමණ්ඩලයේ පුරප්පාඩු 41 ක් හා අනුමත නොවූ කාර්යමණ්ඩලය 26 කගේ අතිරික්තයක් පැවතුණි. | ප්‍රමාණවත් කාර්යමණ්ඩලයක් අනුමත කරගැනීමට කටයුතු කළයුතු වේ. | පිළිගනිමි. |
| (ආ) | සේවක ඇප | | |
| (i) | ප්‍රධාන ලේකම්ගේ එන්සීපි/සීඑස්/ඊසී/3/17 හා 1999 නොවැම්බර් 3 දිනැති අංක 4/1999 දරන ආයතන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 880 හා 881 ප්‍රකාරව මහා නගර සභාවේ ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් පස් දෙනෙකු හැර අනෙකුත් නිලධාරීන් ඇප තැන්පත් කර නොතිබුණි. | සේවක ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප ලබාගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගතිමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නවනගරය සතිපොල ආදායම් රැස්කිරීම්අවස්ථා 18 ක දී ක්ෂේත්‍රයේ එකතු කල රු. 118,075 ක ආදායම් කාර්යාලයට භාරදීමට දින 02 සිට දින 17 දක්වා කාල ප්‍රමාදයක් සිදුවී තිබුණි. | රැස්කල දිනට පසුව එළැඹෙන කාර්යාල දිනයේදී මුදල් ලබා ගැනීමට කටයුතු කල යුතු වේ. | පිළිගනිමි. |

3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) නිෂ්ක්‍රීය වත්කම් රු. 4,830,000 ක් වටිනා Magic BIO KUN TECH – 500 – $A_1$ යන්ත්‍රය, බර්නර් යන්ත්‍රයක් හා ක්‍රෂර් යන්ත්‍රයක් නිෂ්කාර්යව පැවතුණු අතර නිෂ්කාර්යව පැවති කාලය පිළිබඳ තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය. | වත්කම් පූර්ණ උපයෝජනයක් සඳහා කටයුතු කළ යුතු වේ. | නඩත්තු පිරිවැය අධික වීම හා පුහුණු ශ්‍රමිකයන් නොමැතිවීම මත භාවිතයෙන් ඉවත් කර ඇත. |

3.6 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) පිබිදෙමු පොළොන්නරුව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ අන්තර්බන්ධිත ගල් අතුරා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී අන්තර්බන්ධිත ගල් සපයා ගැනීම ප්‍රසම්පාදන ක්‍රියාවලිය මගින් සිදුකළ යුතු බව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම්ගේ දරන 2018 ජූලි 24 දිනැති අංකDPSD010 /පළාත් පාලන ආයතන/2018 Project ලිපිය මගින් පොළොන්නරුව | අදාළ ලිපි ප්‍රකාරව රජයට උපරිම වාසියක් ලැබෙන පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක කල යුතු වේ. | පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම්ගේ 2018 ජූලි 24 දිනැති ලිපිය මහා නගර සභාව වෙත ලැබී නැත. |

මහා නගර සභාව වෙත දැනුම් දී ඇතත් ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් සපයා ගන්නා ලද අන්තර්බන්ධිත ගල් 307,292 ක් සඳහා රු1,843,752 ක අධි වැයක් සිදුවී තිබුණි.

3.7 අවිධිමත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | 2018 අගෝස්තු 29 දිනැති අංක 2086/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනය මඟින් මහා නගර සභාවේ සභිකයින් සඳහා ප්‍රවාහන දීමනාව ගෙවීමටඋපදෙස් නොතිබියදී සමාලෝචිත වර්ෂයේ අගෝස්තු සිට දෙසැම්බර් දක්වා මසකට රු. 4,000 බැඟින් රු.176,000 ක ප්‍රවාහන දීමනා ගෙවා තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීමට කටයුතු නොකල යුතු වේ. | ගෙවා ඇති ප්‍රවාහන දීමනාව අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ii) | ඉහත ගැසට් නිවේදනය මඟින් නියෝජ්‍ය නගරාධිපතිවරයාට රාජකාරී ගමන් සඳහා ඉන්ධන වැය සහා අරමුදලින් දැරීමටඋපදෙස් ලබාදී නොතිබියදී නියෝජ්‍ය නගරාධිපතිවරයාගේ පෞද්ගලික වාහනය සඳහා මසකට ඩීසල් ලීටර් 200 ක් බැගින් ලබාදීම වෙනුවෙන් අගෝස්තු සිට දෙසැම්බර් දක්වා රු. 112,680 ක් ගෙවා තිබුණි. | විධිමත් අනුමැතියකින් තොරව දීමනා ගෙවීමට කටයුතු නොකල යුතු වේ. | පිළිගනිමි. අයකර ගැනීමට කටයුතු කරමි. |

3.8 ප්‍රසම්පාදනය

3.8.1 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ ප්‍රසම්පාදන කටයුතු ඉටුකිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කල යුතු වේ. | විධිමත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කෙරෙමින් පවතී. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන ගිණුම් කාලච්ඡේදය සඳහා පොළොන්නරුව මහ නගර සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණු අතර මු.රෙ.134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයක් සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කල යුතු වේ. | විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ අංක එන්සීපී/සී/එස්/01 විගණන හා 2016 මැයි 11 දිනැති ලිපිය මඟින් විගණන හා කළමනාකරණ කමිටු සෑම මාස 02 කට වරක් පැවැත්විය යුතු බව දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. | කාලානුරූපීව විගණන හා කළමනාකරණ කමිටු පැවැත්විය යුතු වේ. | ඉදිරියේදී අදාළ කාල වකවානු අනුව විගණන හා කළමනාකරණ රැස්වීම් පැවැත්වීමට කටයුතු කරමි. |